සැ.යු.- 2017.06.09 දින පළ වූ අංක 2023 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,024- 2017 ජූනි මස 16 වැනි සිකුරාදා - 2017.06.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 974 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 986 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. -(i) අරවින්ද් කුමාර් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූනි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බන්දුල ලාල් බණ්ඩාරිගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූනි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූලි මස 07 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජූනි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව තුළ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*ශිල්පීය නොවන තනතුරු -*

**01. පුස්තකාල සහයක (111 ශ්‍රේණිය)** **පුරප්පාඩු ගණන - 02**

(බඳවා ගැනීමේ පරිපාටිය - 2016.11.15 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

වැටුප් පරිමාණය : PL-1-2016 (රා. පරි. ච. 3/2016/ අනුව)
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2017 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 16,738/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ)* අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතු ය.)

*(ආ)* වෙනත් සුදුසුකම් :

මෙම දැන්වීමෙහි පහතින් ''*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි*'' යටතේ දක්වා ඇති i සිට iv දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ඇ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස(සා.පෙළ) විභාගයේ දී සාමාර්ථ ලබාගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා, ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02)ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ<br>✓ සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>✓ සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>✓ අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>✓ විශිෂ්ට සාමාර්ථයට - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

**සටහන .-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම ද මෙහිදී සිදු කෙරේ.

**02. ගිනිභට**

(බඳවා ගැනීම් පරිපාටිය - 1999.09.13 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය)

**පුරප්පාඩු ගණන - 05**

*වැටුප් පරිමාණය* - RS- 1 - 2016 (රා. පරි. ච. 3/2016 අනුව)

රු. 29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630/- ආරම්භක වැටුප, මෙම වැටුප් පරිමාණයේ I වෙනි වැටුප් පියවර වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2017 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,384/-)
(තුන්වන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*(අ) බඳවා ගැනීමේ සුදුසුකම් :*

- වයස අවු. 19ට නොඅඩු විය යුතු අතර අවු. 25ට නොවැඩි විය යුතුය. *(ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටින දිනට මෙම වයස් සීමාව සළකා බලනු ලැබේ.)*
  (ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන ගිනිභට පාඨමාලාව හදරා ඇති අයදුම්කරුවන්ගේ වයස් සීමාව ප්‍රථම වතාවට පමණක් අවු. 35 දක්වා දීර්ඝ කරනු ලැබේ.)
- අ.පො.ස. (සා.පෙ.) විභාගයේ අඩු වශයෙන් වාර දෙකකදී, සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් 06කින් සමත් වී තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05ක් එක් අවස්ථාවක දී සමත් වී තිබිය යුතු ය.
- විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
- අඩි 5 අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතු ය.
- රාත්තල් 125ක (56.69 kg) අවම බරකින් යුක්ත විය යුතු ය.
- අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. (දිවුරුම් ප්‍රකාශයක් මගින් අවිවාහක බව සනාථ කළ යුතු ය.)
- මෙම දැන්වීමෙහි පහතින් *''බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි''* යටතේ දක්වා ඇති i සිට ii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*(ආ)* ලිඛිත හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

*ලිඛිත පරීක්ෂණය -*
සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

*ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය-*
ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිතව යෝග්‍යතා පරීක්ෂණයක් සිදු කෙරේ.

*(ඇ) අනෙකුත් සේවා කොන්දේසි :*

- තෝරා ගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු ය. පුහුණු කාල සීමාව තුළ දී වැඩ හා හැසිරීම සතුටුදයක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟාවිය නොහැකි වන පුහුණුකරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකි ය.
- පුහුණු කාල සීමාව තුළ දී රු.10,000/-ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- පුහුණුව සාර්ථකව නිම කරනු ලබන අභ්‍යාසලාභීන් පළාත් රාජ්‍ය සේවයේ ගිනිභට තනතුරට අදළ වැටුප් තලය මත පත් කරනු ලැබේ.
- පුහුණුව සඳහා ඇතුළුවන අවස්ථාවේ දී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05 ක කාල සීමාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු.10,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතු ය.
- පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම අභ්‍යාසලාභීන් සුදුසු කායික තත්වයෙන් සිටින බවට රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.
- පත්වීම්ලාභීන් අදළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පදිංචි වීම අනිවාර්යය වන බවට කොන්දේසියක් සඳහන්ව ඇති බැවින්, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

01. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි (සියළුම තනතුරු සඳහා) :*

(i) අයදුම්කරු **ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු** විය යුතු ය.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න **වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය** ඇති තැනැත්තෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ **වයස** අවුරුදු **18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය.** (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදළ නොවේ.).

(iv) **යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත අයෙකු වීම.**

(v) **ගිනිහට තනතුරු සඳහා වෙනත් වයස් සීමාවක් අදළ වන අතර එම තනතුරට අදළ සුදුසුකම් යටතේ එය සඳහන් කර ඇත.**

(vi) ඉහත පළමුවන ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදළව ඊට පහළින් දක්වා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(vii) 2013.01.01 දිනට පෙර අනුමත වී ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් ඇතැම් කරුණු, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද 2013.01.01 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ **අනුමත කාර්යය මණ්ඩල වාර්තාවේ** සඳහන් තොරතුරු හා අංක 1950/47 හා 2016.01.21 සහ අංක 1986/24 හා 2016.09.28 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ **බලතල පැවරීම්** උපලේඛනයෙහි සඳහන් තොරතුරු සමග නොගැලපෙන අවස්ථාවන් හි දී බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අදළ කොන්දේසි වෙනුවට ඉහත අවස්ථා දෙකෙහි කොන්දේසි අදළ පරිදි ආදේශ වනු ලැබේ.

(viii) අදළ බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව **සම්මුඛ පරීක්ෂණ** සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.)

(ix) කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසලකනු ලැබේ.

*02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) අදළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක විය යුතු ය.

(iii) බඳවාගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වසර 01ක වැඩ පරීක්ෂා කිරීමේ කාලයකට යටත් කරනු ලැබේ.)

(iv) මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

*03. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව, A4 ප්‍රමාණයේ කඩදසියක (අංක 01 සිට 02 දක්වා එක් පැත්තක ද, අංක 03 සිට 06 දක්වා ඉදිරියට අනෙක් පැත්තේ ද වන සේ කඩදසිය දෙපැත්තේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය.

(ii) **අයදුම්පත සමග, ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් ''<u>නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව</u>'' නමට ලබා ගන්නා ලද සහ ගෙවීමේ කාර්යාලය ''<u>දෙහිවල</u>'' ලෙස සඳහන් කරන ලද <u>රු. 200/- ක සාමාන්‍ය මුදල් ඇණවුමක</u> මුල් පිටපත අයදුම්පතෙහි අදළ ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය.**
(ඔබගේ අවශ්‍යතාවය සඳහා මුදල් ඇණවුමෙහි ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම සුදුසුය.)

(iii) අයදුම්පත්‍ර සමග පහත සඳහන් ලියවිලිවල **ඡායාස්ථික පිටපත්** අමුණා එවිය යුතු ය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත් හා අනෙකුත් සහතික ඉදිරිපත් කිරීමට සූදනම්ව සිටිය යුතුය.

*(අ)* ඔබගේ නම සහ ලිපිනය ලියන ලද <u>9" x 4"</u> ප්‍රමාණයේ **ලියුම් කවරයක්,**

*(ආ)* උප්පැන්න සහතිකය,

*(ඇ)* අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතික,

*(ඈ)* වෘත්තිය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,

*(ඉ)* පළපුරුද්ද පිළිබඳ සහතික,

*(ඊ)* ජාතික හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථික පිටපත,

*(උ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 6කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු අතර වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කිරීමේ දී අයදුම්කරුගේ ප්‍රකාශයන් මත පදනම්ව අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම් සළකා බලනු නොලැබේ. '' *උදා.*:- වසර 05ක සිට පදිංචිව සිටින බව පවසයි.''),

*(ඌ)* තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබාගත් පොලිස් වාර්තාවක් (මෙය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 6කට නොඅඩු කාලයක් තුල ලබාගත් එකක් විය යුතුය.)

*(එ)* අවිවාහක බව සනාථ කිරීම සඳහා ලබා ගත් දිවුරුම් ප්‍රකාශයක් **(ගිනිහට තනතුරු සඳහා පමණි)**

(iv) යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා **වෙන වෙනම අයදුම්පත්‍ර** පිළියෙල කර **වෙන වෙනම** කවරවල බහා ඉදිරිපත් කළ යුතු ය.

(v) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර **2017.06.30** වන දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''**නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(vi) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

(vii) තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීමේ හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළු කාරණා පිළිබඳ අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ලෝචනා බාලසූරිය,
නියෝජ්‍ය නාගරික කොමසාරිස්,
නාගරික කොමසාරිස් *(වෙනුවට)*,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2017 මැයි මස 26 වැනි දින.

වාහන විදුලි කාර්මික, පෙදරේරු, වඩු කාර්මික, වාහන පින්තාරුකරු, ඩීසල් කාර්මික, ගස් කපන්නා, රියැදුරු සහ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු යන ශිල්පීය, අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් වැඩි පිරිසකගේ අවධානය යොමු වනු පිණිස එම තනතුරු පුරප්පාඩු නිවේදනය 2017.05.21 දින ප්‍රකාශිත ලංකාදීප පුවත්පතෙහි පළ කරන ලදී.

*දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ*

*.................................................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. **ජීව දත්ත තොරතුරු :**

1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොද මුලකුරු සමග නම : (උදා. - සිල්වා ඒ. බී. සී.)
............................................................................................................................................

1.2 සම්පූර්ණ නම : ..........................................................................................................................

1.3 ස්ථිර ලිපිනය : ..........................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................................................

1.6 දුරකථන අංකය : ..........................................................................................................

1.7 විවාහක/අවිවාහක බව : ..........................................................................................................

1.8 ජාතිය : ................................................................ ආගම : ................................................................

1.9 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

1.10 2017.06.30 දිනට වයස : අවුරුදු ............................ මාස ......................... දින .......................

1.11 බර : .......................................................................... (ගිනිහට තනතුර සඳහා පමණි)

2. *අධ්‍යාපන සුදුසුකම් :*

2.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පන්තිය : ....................................................................................................
පාසල :..............................................................................................................................................................

2.2 අ.පො.ස (සා.පෙළ) විභාගය :
i. විභාගයේ වර්ෂය සහ මාසය : වර්ෂය : .............................. මාසය : ..................................
ii. විභාග අංකය : ...............................................
iii. ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i | | vi | |
| ii | | vii | |
| iii | | viii | |
| iv | | ix | |
| v | | x | |

3. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද :..................................................................................................
එසේනම්,

3.1 ඔබ දැනට දරන තනතුර : ..................................................................................................
3.2 ස්ථිර පත්වීම් දිනය : ...........................................................................................................
3.3 සේවය ස්ථිර කරන ලද දිනය : ...............................................................................................
3.4 වත්මන් තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් ද : ..............................................................................

4. වෙනත් සුදුසුකම් : ...................................................................................................................................

5. *ඉහත තොරතුරු සනාථ කිරීමට අදාළ පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ කිරීම.*

(අදාළ කොටුව තුළ √ හෝ X ලකුණ යොදන්න)

| | ඉදිරිපත් කර ඇති බව |
|---|---|
| 5.1 නම, ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් | |
| 5.2 උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක් | |
| 5.3 අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් | |
| 5.4 ජාතික හැඳුනුම්පතේ දෙපැත්තේ සහතික කළ ඡායා පිටපතක් | |
| 5.5 ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය | |
| 5.6 ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාවක් | |
| 5.7 අවිවාහක බව සනාථ කර ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය (ගිනිහට තනතුරු සඳහා පමණි) | |
| 5.8 ස්ථිර පත්වීම් ලිපියේ පිටපතක් (රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි) | |

6. මුදල් ඇණවුමෙහි මුල් පිටපත එහි දරයකින් නොගැලවෙන ලෙස මෙම කොටුව තුළ අලවන්න.

| |
|---|
| මුදල් ඇණවුමෙහි මුල් පිටපත මෙහි අලවන්න |

6.1 මුදල් ඇණවුමෙහි අංකය : ..................................................................................

6.2 මුදල් ඇණවුම ලබාගත් දිනය : ...........................................................................

6.3 ගෙවන ලද මුදල (රු) : .........................................................................................
(මෙම මුදල් ඇණවුමෙහි ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම පසු විපරමක දී වැදගත් වේ.)

*අයදුම්කරුගේ සහතිකය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

..................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය :....................................................

*සැ. යු.* :- නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06-426

---

## දකුණු පළාත් රාජ්‍ය සේවය - අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

දකුණු පළාත් රාජ්‍ය සේවයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා සීමාව තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *සේවා ගණය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් අමතර පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාථමික ශිල්පීය | 01<br><br>- | PL3-2016 රු.25,790 10x270-10x300-10x330-12x350-රු.38,990 රා.ප.ච 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL3-2016 වැටුප් පරිමාණයේ II වන උප ලේඛනයේ 1 වන වැටුප් පියවර වන රු.15,134/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැළකේ. ( III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.) | 01. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුයි.<br><br>02. පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය.<br><br>03. මෝටර් රථ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතු ය.<br><br>04. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |

| අනු අංකය | තනතුරු නාමය | සේවා ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් ප්‍රමාණය | බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් අමතර පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 02 | පුස්තකාල සහායක III ශ්‍රේණිය | ප්‍රාථමික ශිල්පීය නොවන | 02<br>- | PL1-2016 රු.24250-10x250-10x270-10x300-12x330-රු.36,410 රා.ප.ච 3/2016 වැටුප් පරිවර්තන වගුවේ II වන උපලේඛනයේ I වන වැටුප් පියවර වන රු.14,234/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. ( III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.) | 1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් (06) ක් සමත් විය යුතුය. |
| 03 | (ජල මනු කම්කරු) | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2016 රු.24,250-10x250-10x270-10x300-12x330-රු.36,410 රා.ප.ච 3/2016 වැටුප් පරිවර්තන වගුවේ II වන උපලේඛනයේ I වන වැටුප් පියවර වන රු.14,234/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැළකේ. ( III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.) | 1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් (06) ක් සමත් විය යුතුය. |
| 04 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2016 රු.24,250-10x250-10x270-10x300-10x330-රු.36,410 රා.ප.ච 3/2016 වැටුප් පරිවර්තන වගුවේ II වන උපලේඛනයේ I වන වැටුප් පියවර වන රු.14,234/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැළකේ. ( III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතුය.<br>*කායික සුදුසුකම් :*<br>තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

1. *තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය:* සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

2.2 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.

2.3 අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

2.4 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

2.5 අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

2.6 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත.)

2.7 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සපුරා තිබිය යුතු ය.

2.8 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ / පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

2.9 අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

2.10 මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත නියමිත සුදුසුකම්ලත් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගිය හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි:*

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2 පත්වීම් දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

3.3 වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

3.4 මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට දකුණු පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයන් බැඳී සිටිය යුතු ය.

3.5 මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

4. *අයදුම් කළ යුතු ආකාරය :*

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදසිවල අයදුම්පත් සකස් කර ඉල්ලුම්කරන තනතුර අදාල කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කර 2017.07.14 වැනි දිනට පෙර ලේකම්, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව, බටපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

4.2 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

4.3 නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල, සහතික පිටපත් එවිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. අදාළ කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිළධාරි සහතිකය
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්
5. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය
6. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික

6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී, දකුණු පළාතේ මෙම තනතුරුවලට අදළව නව බඳවා ගැනීමේ පරිපාටි, ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්. පී. ගුණසේකර,
ලේකම්,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 30 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව,
බටපොල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

*අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ .......................................................................... තනතුරට*
*බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය*

(1) *(අ)* මුලකුරු සමග නම :——————————————.

(2) *(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

(3) *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.

(4) *(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :——————————————.

(5) *(අ)* දුරකථන අංකය : පෞද්ගලික :—————— නිවස :——————

(6) ස්ත්‍රී / පුරුෂ භාවය :——————————————.

(7) *(අ)* උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————.

*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————— මාස :—————— දින :——————

(8) ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.

(9) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ?:——————————————.

(10) ජාතිය :——————————————.

(11) විවාහ/අවිවාහක බව :——————————————.

(12) (i) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර)

(ii) සමත් වූ වසර / ශ්‍රේණිය :——————————————.

(iii) අ.පො.ස (සා.පෙළ) විභාග අංකය :——————————————.

(iv) විභාග වර්ෂය හා මාසය :——————————————.

(v) සමත් වූ විෂයයන් :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(vi) අ.පො.ස (උ.පෙළ) විභාගය:——————.

(vii) අ.පො.ස (උ.පෙළ) විභාග අංකය:——————.

(viii) විභාග වර්ෂය හා මාසය:——————.

(ix) සමත් වූ විෂයන්:

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

(13) වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :

(14) සේවා පළපුරුද්ද :——————————————————.

(15) ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද?

එසේ නම් විස්තර :——————————————————.

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් මෙහි ඇතුළත් කිසිවක් සාවද්‍ය බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

——————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු වන ............................ මහතා/ මහත්මිය/ මෙනෙවිය/ දැනට මෙම කාර්යාලයේ .................................. සේවය කරනු ලබන අතර ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කිරීමට එකඟ වෙමි. ඔහු/ ඇය කුමන ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවද මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.

——————,

ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————

06-526

-

## හක්මන ප්‍රාදේශීය සභාව

හක්මන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවශ්‍ය සුදුසකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | (03/ 2016) රා.ප.ච.ලේ අනුව පී එල් 1/2016 රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36410 (ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබිය යුතුයි. |
| 02. | ජල වැද්දුම්කරු | 01 | (03/ 2016) රා.ප.ච.ලේ අනුව පී එල් 2/2016 රු. 25250-10x270-10x300-10 x330-12x350- රු.38450 (ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයන් 06 කින් සමත් වීම හා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා වන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටම සමත්වීම අදාල ක්ෂෙත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
03. තෝරාගනු ලබන සේවක සේවිකාවන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හක්මණ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
05. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු 03ක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :* මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස්කර 2017.07.07 වැනි දිනට පෙර ''ලේකම්, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය. කඩදාසියේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍රද අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

04. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
05. වසර 03කට වැඩි පළපුරුද්ද සම්බන්ධ සේවා සහතිකය,
06. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දැක්වේ.)
2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

එන්.එම්.පී.ජී. අබේවික්‍රම,
ලේකම්,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2017 ජුනි මස 06 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හක්මණ ප්‍රාදේශීය සභාව

**...................................... තනතුර සඳහා වූ අයදුම් පත්‍රය**

01. මුලකුරු සමග නම : ..........................................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම : ..........................................................................................
03. පෞද්ගලික ලිපිනය : ..........................................................................................
04. *(අ)* උපන් දිනය : අවුරුද්ද : ..................... මාසය : ...................... දිනය : ...................
*(ආ)* 2017.07.07 දිනට වයස අවුරුදු : .................... මාස : ..................... දින : ....................
05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? ..........................................
06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ..........................................................................................
07. විවාහක/ අවිවාහක බව : ..........................................................................................
08. සමත්ව ඇති ඉහළ විභාගය : ..........................................................................................
09. ශිල්පීය නිපුණතා : ..........................................................................................
10. වෘත්තීය සුදුසුකම් : ..........................................................................................
..........................................................................................
11. ඔබට උසාවියෙන් දඬුවම් පවරා තිබේ ද? : ..........................................................................................
12. එසේ නම් දඬුවමේ ස්වභාවය : ..........................................................................................
13. දැනට ප්‍රාදේශීය සභාවේ : ..........................................................................................
